**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 22 දින දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 65.87 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 59.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 6.21 ක් හෙවත් සියයට 9.43 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 59.83 | 56.32 | 3.51 | 5.87 |
| මූලධන | 6.04 | 3.34 | 2.70 | 44.70 |
| **එකතුව** | **65.87** | **59.66** | **6.21** | **9.43** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.01.03.00 සඳහා රු.මිලියන 1,200.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,370.45 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 114.20 වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 10.01.03.00 | 1,200.00 | 1,370.40 | 170.45 | 14.20 |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂයය අංක 29601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 5.13 | 5.13 | 2.40 | 2.76 | 20.00 | 12.85 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0048/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 59.41 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0018/0127/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 14.09 ක් විය.

## 2.6 විගණන නිරීක්ෂණය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි. |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iv) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |

### 3.2 අස්ථානගත වූ වවුචර්

සමාලෝචිත වර්ෂයට අදාළ රු.53,938 ක වැටුප් ගෙවීම්වලට අදාළ වවුචරයක් හා අන්තර්ජාල සම්බන්ධතා වෙනුවෙන් ගෙවූ රු.337 කට අදාළ වවුචරයක් අස්ථානගත වී තිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

#### අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ක සිට සියයට 54 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් අංක 10.01.03.00 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,200.00 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, තථ්‍ය ආදායම වශයෙන් රු.මිලියන 1,370.45 ක් රැස්කර තිබුණි. වර්ෂය තුළ ආදායම් වැඩියෙන් රැස් කර ගැනීමට හැකි බව හඳුනාගෙන තිබුණත්, ඒ අනුව ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ චක්‍රලේඛය 9 ඡේදය ප්‍රකාරව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව සෑම වර්ෂයකම ජූලි 31 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව 2015 ඔක්තෝබර් 07 දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) ඉහත සඳහන් චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව අර්ධ වාර්ෂික ආදායම් වාර්තා නියමිත කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ණය ලේඛනයේ (CC10) ශේෂයන් විධිමත් පරිදි තුලනය කර ඉදිරියට ගෙනවිත් නොතිබුණු අවස්ථා විය.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ස්ථාන මාරු වූ දිනයන් හා අගයන් සොයා ගැනීමට නොහැකි ආකාරයට ණය ලේඛනයේ සටහන් යොදා තිබුණු අවස්ථා සහ මකන දියර (Tipex) යොදා සටහන් වෙනස් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. එසේම නිලධාරීන් ස්ථාන මාරුවී ගිය දිනයන්ද සටහන් නොකළ අවස්ථා විය.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු අයවැය රාමුව තුළ නියමිත මුදල් වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි වැය විෂයයන් තුනකට අදාළව ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 9.95 ක් වුවත්, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව එම විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 5.25 ක් වී තිබුණි. ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන කෙරෙහි සැලැකිලිමත් නොවී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් පවත්වා ගැනීමේ වැදගත්කම 2016 පෙබරවාරි 10 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ රැස්වීමේදී අවධාරණය කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් 2017 සැප්තැම්බර් 22 දින වන විටත් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

### 3.6.3 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර පත්කළ යුතු වුවත්, 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2017 පෙබරවාරි 07 දින පත්කර තිබුණි. එසේම චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය හා වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනයන බලපත්‍ර නිකුත් කිරීම්වලට අදාළව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ දත්ත හා ශ්‍රී ලංකා රේගුවේ දත්ත අතර මනා සම්බන්ධීකරණයක් ඇති වන ආකාරයේ පරිගණක ජාලයක් ඇති නොකිරීම නිසා ආනයන බලපත්‍ර යටතේ ආනයනය කළ යුතු ඇතැම් භාණ්ඩ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සාවද්‍ය රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයනය කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආනයන බලපත්‍ර ගාස්තු මත රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වන බවත් ආනයනය සීමා කළ යුතු ඇතැම් භාණ්ඩ සීමාවකින් තොරව ශ්‍රී ලංකාවට ආනයනය කරන අවස්ථා පවතින බවත් නිරීක්ෂණය විය. එසේ ආනයන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනයන් සිදුකර තිබුණු අවස්ථා 13 ක් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ආ) ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී භාණ්ඩවල වටිනාකම පිළිබඳව විධිමත් සොයා බැලීමකින් තොරව ආනයනකරු විසින් ඉදිරිපත් කරනු ලබන ලියකියවිලි මත පමණක් විශ්වාසය තබා බලපත්‍ර ගාස්තු අයකිරීම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ක්‍රියාවලිය වී තිබුණි. ආනයනකරුවන් විසින් එසේ බලපත්‍ර ලබා ගැනීමේදී ඉදිරිපත් කරනු ලබන වටිනාකම් හා ආනයන ලියවිලිවල සඳහන් වටිනාකම් අතර විශාල වෙනස්කම් පවතින බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. බොහෝ විට බලපත්‍ර ලබාගැනීමේදී ඉදිරිපත් කරන මිල ගණන්වලට වඩා ආනයනික ලියවිලිවල සඳහන් මිල ගණන් බෙහෙවින් ඉහළ අගයක් ගෙන තිබුණි. කෙසේ වුවද, ආනයන බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවේදී සඳහන් කර ඇති මිළ ගණන් පදනම් කරගෙන බලපත්‍ර ගාස්තු තීරණය කරන හෙයින් බලපත්‍ර ගාස්තු ලෙස රජයට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය. අවස්ථා 02 කදී ආනයනය කර තිබූ කොන්ක්‍රීට් මික්ෂර් යන්ත්‍ර 02 ක් සඳහා බලපත්‍ර ගාස්තු ලෙස රු.මිලියන 1.30 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 8 | 03 |
| (ii) | ද්විතීයික මට්ටම | 71 | 62 | 09 |
| (iii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 12 | 08 |
| | **එකතුව** | **103** | **83** | **20** |